# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1774/37 – 2012 සැප්තැම්බර් 07 වැනි සිකුරාදා – 2012.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පිටබැද්දර ජලසම්පාදන ක්‍රමයේ ජල පොම්පාගාරය ඉදිකිරීම සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරලේ සුළු කොට්ඨාසයේ, පිටබැද්දර ගමේ පිහිටි පිටබැද්දර ග්‍රාම නිලධාරි වසමේ සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/පීටීබී/2011/461 සහ 2011.12.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0051 ක් පමණ වන මුරුක්කන්දොල නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

**කැබලි අක්ෂර 'ඒ' – මුරුක්කන්දොල – ප්‍රමාණය: හෙක්. 0.0051 ක් පමණ**

උතුරට: මාර්ග (මා.සං.අ.) සහ ඩබ්. එච්. ලලිත් මහින්ද සිරි හිමිකම් කියන මුරුක්කන්දොල වත්ත; නැගෙනහිරට සහ දකුණට: ඩබ්. එච්. ලලිත් මහින්ද සිරි හිමිකම් කියන මුරුක්කන්දොල වත්ත; බටහිරට: ඩබ්. එච්. ලලිත් මහින්ද සිරි හිමිකම් කියන මුරුක්කන්දොල වත්ත සහ මාර්ග (මා.සං.අ.).

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/9/2011/WS/238.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: PTB/LND/ACQUI/7/23.
2012 සැප්තැම්බර් මස 05 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
1200/6, 'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 705

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ පත්තුව උතුර සුළු කොට්ඨාසයේ, ගෝදාව ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මාර/කේඑම්බී/96/215 සහ 1997.12.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0094 ක් පමණ වන පොල් ගස් දෙක වත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

**කැබලි අක්ෂර 'ඒ' – පොල් ගස් දෙක වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0094 ක් පමණ**

උතුරට, නැගෙනහිරට සහ දකුණට: ජේ. වික්‍රමසිංහ හිමිකම් කියන පොල් ගස් දෙක වත්ත; බටහිරට: මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 13/96/WS/128.
2012 ජූනි මස 28 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 706

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.